සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

**අවසාන වාර පරීක්ෂණය 2020** **12 ශ්‍රේණිය**
மூன்றாம் தவணைப் பரீட்சை **2020** தரம் **12**
**Last Term Test 2020** **Grade 12**

සිංහල භාෂාව හා සාහිත්‍යය **II**
**சிங்கள மொழியும் இலக்கியமும் II**
Sinhala Language And Literature **II**

පැය තුනයි
**மூன்று மணித்தியாலம்**
Three Hours

* සැලකිය යුතුයි:

- **I** කොටසේ **I** ප්‍රශ්නය ද **II** කොටසේ 2"3 ප්‍රශ්න ද ඇතුළු ව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- **I** ප්‍රශ්නයේ ඇති සියලුම අනු කොටස්වලට මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
- **I** කොටස, **II** කොටසේ පිළිතුරුපත් සමග අමුණා භාර දෙන්න.

---

## I කොටස

01. එක් එක් ප්‍රශ්නයට වඩාත් ම ගැළපෙන පිළිතුර තෝරන්න. එයට හිමි අංකය වරහන් තුළ ලියන්න.

1.1. දන්තජාක්ෂර පමණක් ඇතුළත් වී ඇති වරණය තෝරන්න.
(1) ත, ඨ, ද, ධ, ම (2) ල, ස, ද, ඨ, න (3) ප, එ, ස, ධ, ණ
(4) ග, ජ, ඩ, ද, බ (5) ට, ඨ, ඩ, ඪ, ණ (........)

1.2. නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පද පේළිය තෝරන්න.
(1) සිත්කලු, නැසෙනසුළු, සුළැඟිල්ල, වලාකුළු, විශිෂ්ට
(2) සිත්කළු, නැසෙනසුලු, සුලැඟිල්ල, වළාකුළු, විශිෂ්ඨ
(3) සිත්කලු, නැසෙනසුලු, සුළැඟිල්ල, වලාකුළු, විශිෂ්ට
(4) සිත්කළු, නැසෙනසුලු, සුලැඟිල්ල, වළාකුළු, විශිෂ්ඨ
(5) සිත්කලු, නැසෙනසුළු, සුළැඟිල්ල, වලාකුළු, විශිෂ්ට (........)

1.3. අකාරාදී පිළිවෙළ අනුව නිවැරදි ව ලියා ඇති පද පේළිය තෝරන්න.
(1) නොනිමි සිත්තම, වහල්ලු, වෙසක් පහන, නංගී
(2) චන්ද්‍රකින්නර, මට්ටකුණ්ඩලී, අනුරුද්ධකුමාර, ස්වර්ණතිලකා
(3) ගුත්තිලය, බැද්දේගම, පේමතෝ ජායතී, නූතන පද්‍ය
(4) සන්ධි, සමාස, තද්ධිත, කෘදන්ත
(5) ඉගිළෙන සිහින, කුකුළු හැවිල්ල, නැළැවිල්ල, ලක් මවුනි මගේ (........)

1.4. පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) රේඵය යනු සිංහලයේ 'ර්' ශබ්දය වෙනුවට යෙදෙන සංකේතයකි.
(2) රේඵය වෙනත් වර්ණයක් සමග අමිශ්‍රව හුදුව වුව භාෂාවේ යෙදිය හැකිය.
(3) රේඵය මූර්ධජ අක්ෂරයක් සමග පමණක් භාවිත වන්නකි.
(4) රේඵය වෙනුවට රකාරාංශය වුව භාවිත කළ හැකිය.
(5) වචනයක ආරම්භක අක්ෂරය ලෙසද රේඵය යෙදිය හැකිය. (........)

1.5 එකිනෙකට අනුරූප වන සේ වචන යුගල යෙදී ඇති වරණය තෝරන්න.
(1) විදේශ ප්‍රවෘත්ති, චන්ද්‍ර මණ්ඩලය, රාජ සභාව, අමාත්‍ය මණ්ඩලය
(2) විහාර මන්දිරය, ත්‍යාග ප්‍රදානය, යෞවන කටයුතු, හිරු මණ්ඩලය
(3) ශුභ මඟුල, ධර්ම ද්වීපය, මුසු කිරිය, බ්‍රහ්ම ලෝකය
(4) ශුභ ප්‍රාර්ථනා, ස්වභාව දහම, මැති සබය, වියරණ විදි
(5) දළදා මැදුර, අටලෝදහම, සන්ධ්‍යා පුවත්, අධිවේගී මාර්ගය (........)

1.6 තත්සම වචන පමණක් යෙදී ඇති වරණය තෝරන්න.

(1) කුලපති, ගුප්ත, සිරස, නුවන (2) වලාකුළු, ආශ්චර්ය, සූර්ය, සේසත

(3) අරම, ලෝකය, කාර්ය, ආසිරි (4) ප්‍රදර්ශන, වෛශාඛ, ප්‍රෞඪ, කෞශල්‍යය

(5) සිරස, අදිටන, විපුල, කනිටු (........)

1.7 තත්භව වචන පමණක් යෙදී ඇති වරණය තෝරන්න.

(1) ප්‍රවෘත්ති, ප්‍රේමය, ස්වප්නය, ධ්‍යාන (2) පුවත්, පෙම, සිහින, දැහැන

(3) ආචාර්ය, අනිවාර්ය, බිරිඳ, චිරිත (4) දේශන, ශීර්ෂ, මනුෂ්‍ය, යෞවන

(5) දහම, ස්වභාවය, කාර්යය, විසුම (........)

1.8 විභක්ති, විශේෂණ, දකාරාර්ථ, අව්‍යය යන සමාසවලට අයත් පද පිළිවෙළින් දක්වා ඇති පේළිය තෝරන්න.

(1) සුසිල්, දූදන, පරපුටු, අබිදම්

(2) කිරිබත්, රතුරෝස, මල්පහන්, තිනෙත්

(3) ලොකුඅම්මා, රතුකිකිළි, යනඑන, දසබල

(4) දසසිල්, ඉරහඳ, බවදුක්, අකීකරු

(5) බුදුබණ, සේනකපඬි, ශිෂ්‍යාශිෂ්‍යා, දූදන (........)

1.9 කෘදන්ත පදයක් අන්තර්ගත fkdjk වරණය තෝරන්න.

(1) රචන, බමන, පවන, සවන (2) නගින, බසින, කරන, කියන

(3) දුවන, පනින, වදන, වඩන (4) ගයන, වයන, ලියන, කියන

(5) රගන, අනින, නමන, හමන (........)

1.10 පහත සඳහන් වැකිවල තද කළු අකුරෙන් මුද්‍රිත පද අයත් වන ක්‍රියා වර්ගය පිළිවෙළින් ඇති වරණය තෝරන්න.

(අ) සදා යෙහෙන් **වැජඹේවා**!

(ආ) ඔහු වැඩ **නිමවා** නිවස බලා පිටත් විය.

(ඇ) ගුරුතුමා සිසුන් ලවා රචනා **ලියවයි.**

(ඈ) ඔබ **දිනුවොත්** රට ම දිනුම්.

(1) ආශීර්වාද ක්‍රියා , පූර්ව ක්‍රියා, අසම්භව්‍ය ක්‍රියා, ප්‍රයෝජ්‍ය ක්‍රියා

(2) පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, ප්‍රයෝජ්‍ය ක්‍රියා, අසම්භව්‍ය ක්‍රියා

(3) ආශීර්වාද ක්‍රියා, පූර්ව ක්‍රියා, ප්‍රයෝජ්‍ය ක්‍රියා, අසම්භව්‍ය ක්‍රියා

(4) පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අසම්භව්‍ය ක්‍රියා, ප්‍රයෝජ්‍ය ක්‍රියා

(5) ආශීර්වාද ක්‍රියා , කර්මකාරක ක්‍රියා, පූර්ව ක්‍රියා, අසම්භව්‍ය ක්‍රියා (........)

1.11 තද්ධිතයක් නොවන පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) නාගරික, ආරාමික, සාංවත්සරික, ආගමික

(2) පෙම්වත්, බීමත්, ආදර්ශවත්, රූමත්

(3) ගඟබඩ, මුහුදුබඩ, වෙරළබඩ, ගලබඩ

(4) මුදුනත්, සවනත්, මුහුණත්, කොපුලත්

(5) සිගිති, පොඩිති, කඩිති, කැබලිති (........)

1.12 උපසර්ගයක් යෙදී නැති පදයක් සහිත පද පේළිය තෝරන්න.

(1) සදොස්, පිළිතුරු, අනුබල, නොවියත්

(2) පසිඳු, සංවාද, නිදුක්, දුලද

(3) අත්‍යුදාර, අස්වාභාවික, දුර්භාග්‍ය, විරාගය

(4) නිරපරාධ, නිරාගමික, නරපණු, නිරාලම්බන

(5) උපනගර, උපවන, උපැස්, උපසභාපති (........)

1.13 නිපාතයක් නොවන පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) මෙන්, සේ, වගේ, බඳු
(2) අනේ, අහෝ, අපෝ, අයියෝ
(3) වහා, සෙද, යුහුව, බුහුමන්
(4) නිතර, සැමදා, දැං, ඉදහිට
(5) වනාහී, වූ කලි, තවද, ඉක්බිති (........)

1.14 ''**දුදනෝ** සුදනන් **මෙන්** නිතර ම **හැසිරෙති**'' යන වැකියෙහි වචන යෙදී ඇති අනුපිළිවෙළ අනුව තද කළු අකුරෙන් මුද්‍රිත පද අයත් වන්නේ මින් කුමන ව්‍යාකරණ අංගවලටද?

(1) සන්ධි, විභක්ති, ක්‍රියා
(2) සමාස, විභක්ති, ක්‍රියා
(3) සන්ධි, සමාස, ක්‍රියා
(4) සමාස, සන්ධි, විභක්ති
(5) සමාස, නිපාත, ක්‍රියා (........)

1.15 සමාන ව්‍යාකරණ ලක්ෂණ නිරූපණය කරන ක්‍රියා රූපය සහිත වරණය තෝරන්න.

(1) දුවයි, පනියි, අඩයි, වැටෙයි
(2) ඉගිළුණහ, දුවති, වැටුණි, පෙනෙයි
(3) කරනු ලබයි, දිසෙයි, නලවයි, ගෙනාහ
(4) ඇවිද්දාය, සිනාසුණේය, ලියවුණහ, කැඩුණෝය
(5) රකිද්දී, බැලුවොත්, හදන්න, නවතින්න (........)

1.16 සමාසයක් නොවන පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) ඇළදොළ, ගස්වැල්, ඉරහඳ, නළුනිළි
(2) අපරාජිත, අපමණ, අපකීර්ති, අපරාධ
(3) සිහිල්පැන්, නිල්අහස , තුන්දොර, වරලස
(4) කම්කරු, ළමාපොත්, වේපස්, දියකිඳුරා
(5) දෙදණ, සිවුපා, අටදිග, දසපනත (........)

1.17 එකම වර්ගයට අයත් සන්ධිපද පමණක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) දකුණත, ධනැති, ගිරග, පනැති
(2) අග්ගලා, කම්මල, සිත්තරු, කොග්ගල
(3) දකුණැස, වමැස, දකුණැලය, වමැලය
(4) නුවණැති, පිනැති, රුවැති, බලැති
(5) දඬුවම්, මුංඇට, අම්මල්, දංගෙඩි (........)

1.18 ව්‍යාකරණානුකුලව නොගැළපෙන පදයක් සහිත වරණය තෝරන්න.

(1) එන්න, යන්න, කරනු, කාපං
(2) පින්වත්, රුමත්, එඩිතර, පියාණෝ
(3) කරන, සරන, පුරන, මරන
(4) වගේ, අගේ, බඳු, වැනි
(5) හිතාහිත, ගුණාගුණ, සුරාසුර, පලාපල (........)

1.19 ව්‍යාකරණානුකුල ව නිවැරදි වැකිය තෝරන්න.

(1) විදේශිකයන් ලංකාවේ නිරෝධායන වැඩපිළිවෙළ අගයති.
(2) ගායකයන් ගී ගයනු වස් ප්‍රසංග වේදිකාවට පැමිණ ඇත.
(3) විමල් හෝ කමල් සාක්ෂි දෙති.
(4) ක්‍රීඩා බලධාරීහු ප්‍රේක්ෂකයන්ට පහර දුන්නේහ'යි මාධ්‍ය වේදීහු පවසති.
(5) එක් අයෙක් තරගයෙන් ඉවත් වෙති. (........)

1.20 ලේඛන ව්‍යවහාරයට වඩාත් සුදුසු වාක්‍යය සහිත වරණය තෝරන්න.

(1) මදැයි අපිත් රස්සාවල් ගන්න බලන් හිටිය.
(2) වැරදි කොරන එවුන්ට මේව හොඳ පාඩං.
(3) ඒ ගොල්ලො උදේ හිටං ඔයා එනලක් බලං හිටිය.
(4) කාට තියන සල්ලි ද ඕවට වියදං කරන්න.
(5) කැමට පෙර අත සෝදන්න. (........)

## II කොටස

මෙම කොටසින් **2,3** ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

2. (අ) පහත සඳහන් පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

චීනයේ චැං ඊ-4 නමැති අභ්‍යවකාශ යානය මගින් ගෙන ගොස් සඳ මත සිටුවන ලද බීජ පැළ වී ඇතැයි චීනයේ ජාතික අභ්‍යවකාශ අධිකාරිය පවසයි. සඳ මත යම් ජීව විද්‍යාත්මක ද්‍රව්‍යයක් රෝපණය වූ පළමු අවස්ථාව ලෙස මෙය සටහන් වන අතර එය දීර්ඝ අභ්‍යවකාශ තරණයන් සඳහා තැබූ වැදගත් පියවරක් ලෙස සැළකේ. චැං ඊ-4 යනු පෘථිවියට ප්‍රතිවිරුද්ධව පිහිටි සඳේ මතුපිට පෘෂ්ඨයට ගොඩ බැස් වූ පළමු අභ්‍යවකාශ යානයයි. එම පෘෂ්ඨයේ භූගර්භ විද්‍යාත්මක ලක්ෂණ විශ්ලේෂණය කිරීම සඳහා අවශ්‍ය උපාංග රැගත් චැං ඊ-4 යානය සඳ මත ගොඩ බැස්වූයේ 2019 ජනවාරි මස තුන්වන දාය. මීට පෙර ජාත්‍යන්තර අභ්‍යවකාශ මධ්‍යස්ථානයේ ශාක රෝපණය කර ඇතත් සඳ මත මීට පෙර ශාක රෝපණය කර නොතිබුණි. සඳ මත ශාක රෝපණය කළ හැකි වුවහොත් එය අඟහරු තරණය වැනි වසර දෙක හමාරක් තරම් දීර්ඝ අභ්‍යවකාශ ගමන්වලට උපකාර වනු ඇත.එ ඒ අනුව ගගනගාමීන්ට ආහාර රැගෙන යාම සඳහා යළි පෘථිවියට නොපැමිණ අභ්‍යවකාශය මත ම සිය ආහාර නිෂ්පාදනය කර ගත හැකි වනු ඇත. චීන චන්ද්‍ර යානය මගින් පුළුන් බීජ, අර්තාපල් බීජ, යීස්ට හා බිම්මල් බීජ ආදිය යෙදූ පස් සඳ වෙත රැගෙන යන ලදී. මෙම ශාක යානය තුළ මුද්‍රා තබන ලද බහාලුම්වල තබා තිබේ. මෙම වගාව හරහා කෘත්‍රිම ස්වයං පෝෂිත ජෛව ගෝලයක් නිර්මාණය කිරීමට නියමිතය. සඳ මත ඇති පුළුන් බීජ දලු දමා ඇති බව චීන රාජ්‍ය මාධ්‍යය 2019 ජනවාරි 15වන දා නිවේදනය කළේ ය. චීන පාලක පක්ෂය වන කොමියුනිස්ට් පක්ෂයේ නිල පුවත්පත වන පීපල්ස් ඩේලි පුවත්පත, ට්විටර් පණිවිඩයක් හරහා ඡායාරූපයක් පලකරමින් සඳහන් කර තිබුණේ, ''සඳ මත මිනිසුන් විසින් කරන ලද පළමු ජීව විද්‍යාත්මක පරීක්ෂණය'' එමගින් සනිටුහන් වූ බවයි.

(i) චැං ඊ-4 යානය සඳ මත ගොඩ බැස්වූයේ කවදා ද?

(ii) චැං ඊ-4 යානය ඉතිහාසයට එක්වන්නේ කවර වැදගත් යානයක් ලෙසද?

(iii) සඳ මත බීජ රෝපණය කිරීම දීර්ඝ අභ්‍යවකාශ තරණය සම්බන්ධයෙන් වැදගත් පියවරක් වන්නේ ඇයි?

(iv) අඟහරු තරණයට ගතවන කාලය කොපමණද?

(v) චීන චන්ද්‍ර යානය මගින් රෝපණය කරන ලද බීජ වර්ගයන් කවරේද?

(vi) මෙම ඡේදයේ සඳහන් චීන පාලක පක්ෂය හා එහි නිල පුවත්පතේ නම කුමක් ද?

(ලකුණු 12 යි.)

(ආ) පහත දැක්වෙන උද්ධෘතය කියවා, එහි වචන සංඛ්‍යා තුනෙන් එකක් පමණ වන සේ සාරාංශ කොට ලියා, සාරාංශය අග වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

සහභාගිත්ව සංවර්ධනය බිහිවන්නේ දුප්පත් ජනතාවගේ ස්වශක්තිය, සහභාගීත්වය එක්වී බිහිවන නිර්මානීය නවෝත්පාදන ශක්තිය තුළිනි. එහෙයින් ම මෙම සහභාගීත්ව සංවර්ධන ක්‍රියාවලිය අතිශයින් ම ගැඹුරු වනු පෙනේ. එමෙන් ම අර්ථවත් වනු දිසේ. අනෙක් අතට ජනතා පදනමක් ද එහිලා පෙනේ. එමතු ද නොව පවත්නා සාම්ප්‍රදායික සංවර්දනය වෙනුවට බිහිවන විකල්ප සංවර්ධන ක්‍රියාවලියක් ද වනු ඇත. සහාභාගීත්ව සංවර්ධනය බාහිර මූල්‍යාධාර, මහජන ප්‍රයෝජනයට අදාළ විවිධ සහනාධාර හෝ වෙනත් ද්‍රව්‍යමය ආධාර ආදිය අපේක්ෂාවෙන් ආරම්භ කරනු ලබන සංවර්ධන ක්‍රියාදාමයක් නම් නොවේ. සාම්ප්‍රදායික සංවර්ධනයේ දී දිළිඳු ජනතාවගේ නිර්මාණ ශක්තිය මතු වීමට පෙරාතුව ම බාහිර ආධාර ඉස්මතු වෙයි. ඒ සමඟ ම නැඟී එන අංකුර නවෝත්පාදන දහරා වියැකී යයි. නමුත් සහභාගීත්ව සංවර්දනයේ දී බාහිර ආධාරයන් මත නොව ජනතාවගේ ස්වශක්තිය හා සහභාගීත්වය එක්වීමෙන් බිහිවන නිර්මාණ ශක්තිය සංවර්ධනයේ ඒකායන බලවේගය බවට පත් වෙයි. බාහිර ආධාර සහ සහනාධාර මත පදනම් වූ වැඩසටහන් හම ආධාර ලැබීම නැවතීමත් සමඟ ම ඇණ හිටී. නැතහොත් අතුරුදහන් වනු ඇත. නමුත් සහභාගීත්ව සංවර්ධනයේ දී එසේ නොවන්නේ ජනතාවගේ නිර්මාණාත්මක නවෝත්පාදන ශක්තිය ඒ වන විට වර්ධනය වී සියත් බව තුළ සහාභාගීත්වයේ ම රැඳෙන බැවිනි.

(ලකුණු 13 යි.)

3. දී ඇති මාතෘකාවලින් එකකට අදාළ ව වචන 300-350 අතර වන සේ විශ්ලේෂණාත්මක රචනයක් ලියන්න.

(i) ලොවම භීතියට පත් කළ මාරාන්තික කොරෝනා වෛරසය.

(ii) රජයේ රැකියා ලබාදීම නිර්දේශපාලනික විය යුතුය.

(iii) පුද්ගලයාගේ චරිත සංවර්ධනයට ක්‍රීඩාවෙන් ලැබෙන පිටු බලය.

(iv) අවර ගණයේ ගීත කලාව හා නව පරපුරේ රසාඥතාව.

(v) ගෝලීය උෂ්ණත්වය ඉහළ යාමේ තර්ජනය.

(ලකුණු 25 යි.)

4.(අ) පහත සඳහන් වාක්‍යවල සදොස් තැන් ඇතොත් නිදොස් කොට ලියන්න.

(i) දරුවෝ පාඩම් කරති'යි දෙමාපියන් සිතති.

(ii) වෙළෙන්දෝ උද්‍යසනින් ම වෙළඳපොළට පැමිණ ඇත.

(iii) ඔවුන් දැහැමි සමාජයක් නිර්මාණය කරාවි.

(iv) නිළියක වූ ඇය ගායිකාවක ද වූවාය.

(v) සියලු ලාංකිකයන් යහපත් සිත් ඇත්තන් වේවා.

(ආ) පහත සඳහන් වාක්‍ය කර්මකාරයට හරවන්න.

(i) ලෝක සෞඛ්‍ය සංවිධානය කොරෝනා වෛරසය ''කොවිඩ් 19'' ලෙස නම්කරයි.

(ii) වෛද්‍යවරු වැඩ වර්ජනය අත්හරිති.

(iii) ඇමතිතුමා නව ලේකම් වරියක පත් කළේය.

(iv) වියරණ ඇදුරෝ කලින් කලට නව භාෂා රීතීන් හඳුන්වා දෙති.

(v) ගුරුවරු මා පසසති.

(ඇ) නිවැරදි වාක්‍යයක් නිර්මාණය කිරීම සඳහා සුදුසු පදය වරහන් තුළින් තෝරා ලියන්න.

(i) නූතන (සාහිත්‍යකරුවෝ/සාහිත්‍යකරුවන්) සමාජයෙන් ඈත්ව නිර්මාණ (කරයි/කරති).

(ii) ජනාධිපතිතුමා (ඇමතිවරන්/ඇමතිවරු) කොළඹට (කැඳෙව්වෝය/කැඳෙව්වේය)

(iii) නව (සාමාජිකයෝ/සාමාජිකයන්) විසිපස් (දෙනෙකු/දෙනෙක්) අප පක්ෂයට එක් වූහ.

(iv) (මා/මම) වැරදිකරුවෙකු නොවන බව උසාවිය සනාථ (කළෙමි/කළේය.)

(v) (අප/අපි) මේ තරගය ජයගතහොත් එය නව වාර්තාවක් (වෙයි/වෙති)

(ලකුණු 05 x 3 = 15 යි)

5. පහත දැක්වෙන වාක්‍යවල තදකළු අකුරින් මුද්‍රිත පදවල ව්‍යාකරණ අංගය දක්වා ඇත. ඒවායෙහි අනු අංගය දක්වන්න.

(i) **පියාණෝ ඉමහත්** වෑයමකින් **දරුවන්** පෝෂණය කළේය.
(පියාණෝ - තද්ධිත, ඉමහත් - සමාස, දරුවන් - විභක්ති)

(ii) ත්‍යාග **ප්‍රදානෝත්සවයේ** දී **ශිෂ්‍යශිෂ්‍යාවන්** රැසකට **නොයෙක්** සම්මාන පිරිනැමුණි.
(ප්‍රදානෝත්සවයේ - සන්ධි, ශිෂ්‍යශිෂ්‍යාවන් - සමාස, නොයෙක් - සන්ධි)

(iii) **ඔහු දියෙන්** ගොඩගත් මාලුවකු **සේ** දඟලන්නට විය.
(ඔහු - සර්වනාම, දියෙන් - විභක්ති, සේ - නිපාත)

(iv) **පන්සිල් රකින** සමාජයක් **ඉක්මනින්** බිහිකිරීම කාගේත් වගකීමයි.
(පන්සිල් - සමාස, රකින - කෘදන්ත, ඉක්මනින් - විශේෂණ)

(v) **විභාගාපේක්ෂකයා** ප්‍රශ්න පත්‍රය **කියවා පිළිතුරුපතෙහි** ලිවීම ඇරඹීය.
(විභාපේක්ෂකයා - සන්ධි, කියවා - ක්‍රියා, පිළිතුරුපතෙහි - විභක්ති)

(ලකුණු 05 x 3 = 15 යි)

6. (අ) පහත දැක්වෙන වාක්‍යවල හිස්තැනට වඩාත් ම ගැළපෙන පදය වරහන තුළ දීඇති පද අතුරෙන් තෝරා ලියන්න.

(නඩත්තු/ ප්‍රතිසංස්කරණය/ චිරස්ථිතිය/ සංවත්සරය/ පුනරුත්ථාපනය/ සංරක්ෂණය)

(i) පුරාණ ස්මාරක ............................ පුරාවිද්‍යාඥයින්ගේ මූලික කාර්යභාරයයකි.
(ii) ඇතැම් ගොඩනැගිලි නිරතුරුව ම ................................. කළ යුතු ව ඇත.
(iii) රජය, මතට ලොල් වූවන් .......................................... කරයි.
(iv) අප විදුහලේ ...................................... උත්සවය නොබෝදා පැවැත්විණි.
(v) බුදු සසුනේ ................................. සඳහා රජයේ අනුග්‍රහය අත්‍යවශ්‍ය වේ.
(vi) විදුලි බලාගාර නිරන්තරයෙන් ........................ කිරීම බලධාරීන් සතු කාර්යයකි.

(ලකුණු 1/2 x 6 = 03 යි)

(ආ) පහත පහත දක්වා ඇති පද සන්ධි කර ලියන්න.

(i) අති + අවශ්‍ය
(ii) ගුරු + උපදේශ
(iii) ඔවුන් + ඔවුන්
(iv) වීර + උදාර
(v) මුනි + ඉන්ද්‍ර
(vi) පහ + අග

(ලකුණු 1/2 x 6 = 03 යි)

(ඇ)තදකළු අකුරින් මුද්‍රිත පදවල විභක්ති නම් කරන්න

(i) **ධාවකයා** වේගයෙන් ගොස් **ජීවකයන්** සොයාගත්තේය.
(ii) **අම්මේ**, බඩගිනි **අයට** බත් දුන මැනවි
(iii) **අත්තෙහි** ඇති **කුරුල්ලන්ගෙන්** අපට කරදරයක් නැත.

(ලකුණු 1/2 x 6 = 03 යි)

(ඈ)අවශ්‍ය තැන්වල විරාම ලක්ෂණ යොදා පහත දැක්වෙන වාක්‍ය නැවත ලියන්න.
(i) ශ්‍රී ලංකාව, ඈත අතීතයේ දී පෙරදිග ධාන්‍යාගාරය යන නමින් හඳුන්වන ලදී
(ii) අනේ එවිපත සිදුවුණි නොදනිමි කාගෙ දොසා
(iii) අප පාසලේ විද්‍යාගාරයක් සෞන්දර්ය ඒකකයක් ක්‍රීඩාගාරයක් නැත.

(ලකුණු 1/2 x 6 = 03 යි)

(ඉ) පහත දැක්වෙන ප්‍රකාශවල එක් එක් ප්‍රකෘති කථනය විකෘති කථනයට හරවා ලියන්න.

(i) ''අපි එදා උදෙන්ම ඉස්කෝලෙට ගියා''යි දරුවෝ ප්‍රකාශ කළහ.
(ii) ''මම මගේ වැඩ ඔක්කොම තනියම කරගන්නවා''යි මහල්ලා පැවසීය.
(iii) ''අම්මලා තාත්තලා මෙවට වගකියන්න ඹනෙ''යි දේශකයා කීවේය.

(ලකුණු 1/2 x 6 = 03 යි)

7. පහත ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

සහෘදයාගේ පඤ්චේන්ද්‍රියන්ගේ ම මාර්ගයෙන් ඔහුගේ සිතට පිවිස ඔහු තුළ හවෝද්දීපනයක් ඇති කිරීමට සමත් වන **වාක්චිත්‍ර** සංකල්පරූප ලෙස හැඳින්විය හැකිය. උපමා **රූපක** ප්‍රධාන වශයෙන් ඊට අයත් වේ. සංකල්පරූපවල සාර්ථකත්වය උදෙසා ඒවායේ අනිවාර්යයෙන් ම වියයුතු ගුණාංග අතර ප්‍රධාන වන්නේ එහි ඇති අපූර්වත්වයයි. එනම් නව්‍ය ස්වරූපයයි. එමෙන් ම **කවියෙන්** නිරූපිත හාවයන්ට අනුව **හැසිරීමත්** කවියේ මුඛ්‍ය රසයන් පෝෂණය කිරීමත් සංකල්පරූප මගින් සිදුවිය යුතුය. එසේ නොවන විට සංකල්පරූප කවියට භූෂණයක් නොව **දූෂණයක්** වේ. උපමා හාෂණය සංකල්පරූප අතර ප්‍රධාන තැනක් ගනී. මෙහිදී උපමාවක් තුළ දක්නට ඇති ප්‍රධාන අංගද්වයයකි. එනම් උපමානය හා උපමේය යි. උපමානය යනු සමාන කරන වස්තුව යි. උපමේය යනු **වර්ණනා** කිරීමට අපේක්ෂිත වස්තුවයි. මීට අමතරව උපමාවාචී නිපාතය හා සමාන ධර්මය යන කරුණු කෙරෙහි ද සැළකිල්ල යොමු විය යුතු ය. අනුචිත උපමා හාවිතය කවියෙහි රසයට ප්‍රබල **බාධාවකි**. ''අනෞචිත්‍යාද්දෘතේ නාන්‍යං රසහංගස්‍ය කාරණම්'' යනුවෙන් සංස්කෘත ආලංකාරිකයන් දක්වා ඇත්තේ එබැවිනි. එබැවින් මැනවින් බස ද හසුරුවමින් මනා අලංකාරයන් යෙදූ නිර්මාණය සහෘද සිත් පුබුදු කරවයි.

(i) ඡේදයේ තදකළු අකුරින් මුද්‍රිත පද අකාරාදි පිළිවෙළට සකස් කර ලියන්න.
(ii) හැඳින්විය, නිරූපිත, අපේක්ෂිත යන වචනවල ඇති පිලි වෙන වෙන ම ලියන්න.
(iii) ඉහත ඡේදයෙන් උපුටා දක්වන්න.
    1. මහප්‍රාණ අක්ෂරයක් හා මූර්ධජ අක්ෂරයක් එක ළඟ යෙදී ඇති වචනයක්,
    2. දන්තජ අක්ෂරයක්, නාසික්‍ය අක්ෂරයක්, අනුපිළිවෙළින් යෙදී ඇති වචනයක්,
    3. කණ්ඨජ අක්ෂරයක් හා අන්තඃස්ථාක්ෂරයක් යෙදී ඇති වචනයක්
(iv) පහත සඳහන් පද විසන්ධි කර සන්ධි විදිය දක්වන්න.
    පඤ්චේන්ද්‍රියන්ගේ, හවෝද්දීපනයක්, ආලංකාරිකයන්
(v) පහත දැක්වෙන ක්‍රියා වර්ගවලට උදාහරණ වචනය බැගින් ඡේදයෙන් උපුටා ලියන්න.
    පූර්ව ක්‍රියා, මිශ්‍රක්‍රියා, ප්‍රයෝජ්‍ය ක්‍රියා

(ලකුණු 03 x 5 = 15 යි)

8. පහත සඳහන් මාතෘකාවලින් තුනක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

(i) අක්ෂර මාලාවේ සෝෂ අසෝෂ හේදය.
(ii) අනියමාර්ථ තද්ධිතය.
(iii) පූර්ව ස්වර ලෝප සන්ධිය.
(iv) රේඵය හා රකාරාංශයේ හාවිතය.
(v) අව්‍ය සමාසය

(ලකුණු 05 x 3 = 15 යි)